# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2145/29 - 2019 ඔක්තෝබර් මස 15 වැනි අඟහරුවාදා - 2019.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/COM/04/2018/104

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.22 දිනැති හා අංක 2115/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් අම්පාර, ගැමුණුපුර, අංක බී/340/1, හි පදිංචි කේ. ඒ. ඩී. රංජිත් ප්‍රේමලාල් මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.09.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019, ඔක්තෝබර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/COM/04/2018/104

වර්ෂ 2019 ක් වූ සැප්තැම්බර් මස 20 දින කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික අධිකරණයේදී ය

කේ. ඒ. ඩී. රංජිත් ප්‍රේමලාල්,
නො. බී/340/1, ගැමුණුපුර,
අම්පාර.

*(පළමු පාර්ශවය)*

A/25/2019 එරෙහිව

ශ්‍රී ලංකා ගමනාගමනා මණ්ඩලය,
නො. 200, කිරුළ පාර,
කොළඹ 05.

*(දෙවන පාර්ශවය)*

අතර පවතින කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් මගින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය මගින් ඉහත පාර්ශවයන් අතර හට ගෙන ඇති කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා එස්. ජී. සූරියආරච්චි වන මා බේරුම්කරු ලෙස පත් කර ඇත.

එම පත්කිරීම අනුව ඉහත දෙපාර්ශවය අතර පවතින ආරවුල බේරුම්කරණයෙන් නිරවුල් කිරීම සඳහා දෙපාර්ශවය කාර්මික අධිකරණය ඉදිරියට කැඳවන ලදී.

**ආරවුලේ ස්වභාවය :**

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන කේ. ඒ. ඩී. රංජිත් ප්‍රේමලාල් යන අයට රිය අනතුරක් සිදු කිරීම යන චෝදනාව මත 2015.12.02 දින සිට 2016.07.29 දින දක්වා සේවා තහනමකට ලක් කරන ලද අතර එකී කාල සීමාව වන මාස 07 දින 27 ක් සඳහා අඩ වැටුප් ඉල්ලා සිටීමත්, රිය අනතුර මගින් බස් රථයට සිදු වූ අලාභය ලෙස ඉල්ලුම්කරුගෙන් අය කර ගත් රු. 12,660/- මුදල වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් ඉල්ලා මෙම නඩුව පවරා ඇත.

**පසුබිම :**

ඉහත ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019.07.02 දින දෙපාර්ශවය කාර්මික අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස කරනු ලැබූ නියෝගය පරිදි එදින පෙනී සිටි අතර මෙම ආරවුල


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සම්බන්ධව යම් සමථයක් සඳහා සත්‍යතාවයක් තිබේදැයි අධිකරණය විසින් විමසන ලදී.

එහිදී ඉල්ලුම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි නියෝජිත මහතා සමථ යෝජනාවක් ලෙස ආරවුල අදාළ කාල සීමාව වන මාස 07 දින 27 ක් සඳහා අඩවැටුප් හා බස්රථයේ අලාභය ලෙස ඉල්ලුම්කරුගෙන් අය කර ගත් රු.12,660/- මුදල ඉල්ලුම්කරු වෙත ලබා දෙන්නේ නම් නඩුව අවසන් කිරීමට සූදානම් බව ප්‍රකාශ කරන ලදී.

වග උත්තරකාර පාර්ශ්වය එම යෝජනාවන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලැබෙන්නේ නම් ඒ බව ගරු කාර්මික අධිකරණය වෙත දැනුම් දිය හැකි බවට ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව සමථය හෝ විභාගය සඳහා මෙම නඩුව 2019.08.22 දින නැවත කැඳවන ලද අතර එහිදී ඉල්ලුම්කරු වැඩ තහනමකට ලක් කර සිටි 2015.12.02 සිට 2016.07.29 දින දක්වා කාලය සඳහා අඩවැටුප් ගෙවීමට එකඟවන අතර බස්රථයට සිදු වූ අලාභය වන රු. 12,660/- මුදල ඉල්ලුම්කරු වෙත ගෙවීම ප්‍රතික්ෂේප කරන බව වගඋත්තරකාර ආයතනය විසින් කාර්මික අධිකරණය හමුවේ ප්‍රකාශ කරන ලදී.

එයට ප්‍රතිචාර දක්වමින් ඉල්ලුම්කාර පාර්ශවය වැඩ තහනමට ලක් වූ කාලය සඳහා අඩවැටුප් ලබා ගෙන ආරවුල සමථයකට පත් කර ගැනීමට එකඟත්වය පළ කර සිටින ලදී. ඒ අනුව අඩවැටුප ලෙස ගණනය කළ වැටුප් ප්‍රමාණය වන රු. 151,573.40 බවත් එම මුදල අඩවැටුප ලෙස ගෙවීම සඳහා නැවත දිනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස මෙම නඩුව 2019.09.20 දින නැවත කැඳවන ලද අතර එදින රු.151,573.40 ක් වූ අඩ වැටුප් හිඟ මුදල ඉල්ලුම්කරු වෙත වගඋත්තරකාර ආයතනය විසින් අංක 589807 යූනියන් පෙදෙස මහජන බැංකුව නමින් 2019.09.11 දිනැති චෙක්පතකින් ගෙවීම් කරනු ලැබීමෙන් පසු ආරවුල සමථයකට පත් කරන ලදී.

මෙම සමථය ප්‍රදානයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන අතර මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවත් ප්‍රකාශ කරමි.

බේරුම්කරු,
එස්. ජී. සූරියආරච්චි.

2019 සැප්තැම්බර් මස 20 වැනි දින.

11 - 55